# පටුන

| අන්තර්ගතය | පිටු අං. |
| --- | --- |
| 1. විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම | 01 - 02 |
| 2. ආයතනික තොරතුරු | 03 - 05 |
| 3. ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිවරයාගේ ලිපිය | 06 |
| 4. මානව සම්පත් සංවර්ධනය | 07 - 08 |
| 5. රෝහල් සේවා විශ්ලේෂණය | 09 - 20 |
| 6. 2015 වසරේ ප්‍රධාන සාධනයන් | 21 - 24 |
| 7. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය | 25 -26 |
| 8. 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය ට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 27 - 42 |
| 9. විගනකාධිපතිවරයාගේ සහතිකය හා විගනකාධිපති වාර්තාව 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) c වගන්තිය ප්‍රකාරව | 43 - 53 |

**<u>දැක්ම</u>**

අනගිතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම

**<u>මෙහෙවර</u>**

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම.

**<u>සාමූහික අභිමතාර්ථයන්</u>**

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

# විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ 2015 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

## 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා

### ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදූව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදූව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදූවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකින් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදූවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග අනුස්මරන පදනම ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශෛල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම් සඳහා පමණි. එසේ වුවද, අඩු වරප්‍රසාදිත ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස, 2004 දී මූලිකව ඇරඹී සමස්ත ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් කරමින් ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම දියත් කර ඇත. ඒ අතර ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලදී.

2012 වසරේ දී වර්ග අඩි 4,061 කින් යුත් වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය සාමාන්‍ය ගබඩා, වෛද්‍ය වාර්තා ගබඩාව, රාජකාරී කාමර හා සම්මන්ත්‍රණ ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

වර්ග අඩි 4386 ක බිම ප්‍රදේශයක් සහිත තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම 2015 වසරේ දී අවසන් කර ගැනීමට හැකි විය. එතුල රසායනාගාරය, තුවාල ප්‍රතිකාර ඒකකය, උපයෝගිතා කාමර වැනි පහසුකම් වැඩිදුර සැපයීම සිදු විය. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තැනූ මෙම ගොඩනැගිල්ල 2015 සිට භාවිතා කෙරේ.

හිස් ප්‍රදේශ සියල්ල වාට්ටු පහක් බවට පරිවර්තනය කරමින් රෝගීන්ගේ භාවිතාව සඳහා යොදා ගැනීම නිසා මේ වන විට ඇඳන් ප්‍රමාණය 164 කි.

රෝහල ඉදිරිපස ඇති පරිපාලන ගොඩනැගිල්ල අඩු වියදම් තර්ඩ් තාක්ෂණය මගින් රු. මිලියන 35 ක වියදමකින් වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනාවක් 2015 වසරේ දී අනුමත වී එහි මූලික කාර්යයන් එම වසරේ දීම ආරම්භ කෙරිනි

රෝහලේ යටිතල පහසුකම් රු. මිලියන 1384 ක වියදමකින් මහා පරිමාණයෙන් දියුණු කිරීමේ යෝජනාවක් අනුමත වී ඇත. රෝගීන්ගේ එදිනෙදා අවශ්‍යතා පිරිමසනු පිණිස රෝහලේ දැනට ඇති දැඩි අපහසුතා වලක්වා ගැනීමඅරමුණින් මෙම මහල් හතකින් යුත් ගොඩනැගිලි ව්‍යාපෘතියේ මූලික කාර්යයන් දියත් කර ඇත.

## ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

## ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදූව

## කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

## නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

## විගනකවරු

- විගනකාධිපති, විගනකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල
    - අභ්‍යන්තර විගණන ඒකකය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
      385, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත,
      "සුවසිරිපාය"
      කොළඹ 10

# අධ්‍යක්ෂ මණ්ඩලය

**විජය කුමාරතුංග අනුස්මරන රෝහල**

**සීදූව**

**01-01-2015 ~ 31-12-2015**

---

මහා. කාලෝ පොන්සේකා

සභාපති

- වෛද්‍ය පාලිත මහීපාල, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ

එන්.ඒ. උමගිලිය මයා, වෘත්තීය නියෝජිත

අධ්‍යක්ෂ

වෛද්‍ය පී.එස්. ජයලත් මිය, රෝහල් නියෝජිත

අධ්‍යක්ෂ

වෛද්‍ය විමුක්ති කුමාරතුංග, විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පදනමේ සාමාජික

(චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නියෝජිත)

අධ්‍යක්ෂ

සමීර වික්‍රමසිංහ මයා (01-01-2015 සිට 10-03-2015 දක්වා),

ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා (10.03.2015 සිට 31-12-2015 දක්වා),

භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂ

චන්ද්‍රා වික්‍රමසිංහ මයා

අධ්‍යක්ෂ

# විගණන කමිටුව

## 01-01-2015 ~ 31-12-2015

සමීර වික්‍රමසිංහ මයා, භාණ්ඩාගාර නියෝජිත **(01-01-2015 සිට 10-03-2015 දක්වා)**
සභාපති

ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා, භාණ්ඩාගාර නියෝජිත
**(10-03-2015 සිට 31-12-2015 දක්වා)**

එස්.ආර්. රාජපක්ෂ මයා, ප්‍රධාන ගණකාධිකාරී, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නිරීක්ෂක

බී.ජී.අයි. නිරංජා මිය, ගිණුම් අධිකාරි, විගනකාධිපති දෙපාර්තමේන්තුව
නිරීක්ෂක

වෛද්‍ය පී.එස්. ජයලත් මිය, කාර්‍ය භාර වෛද්‍ය නිලධාරී , වි.කු.අ.රෝ.
සාමාජික

**K.M.Y.K.** කරුණාරත්න මිය, ගණකාධිකාරී, **W.K.M.H.**
සහභාගීත්වය

# බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදූව

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

**2015 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව**

1971 අංක 38 දරණ මුල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

මහා. කාලෝ ෆොන්සේකා,
සභාපති,
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සීදුව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# මානව සම්පත් සංවර්ධනය

## A. කාර්ය මණ්ඩල සංඛ්‍යාව - **2015** දෙසැම්බර් 31 දිනට

1. විධායක කාර්ය මණ්ඩලය — 04
    - a. කාර්ය භාර වෛද්‍ය නිලධාරි
      හෙද නිලධාරි
    - b. ගණකාධිකාරි
    - c. පරිපාලන නිලධාරි
2. වෛද්‍ය විශේෂඥවරු — 07
    - a. ස්ථිර 02
      (අක්ෂි ශල්‍ය වෛද්‍ය, වෛද්‍ය)
    - b. බාහිර 05
      (සාමාන්‍ය ශෛල්‍ය වෛද්‍ය, ළමා රෝග වෛද්‍ය, නිර්වින්දන වෛද්‍ය, මානසික රෝග වෛද්‍ය හා වෛද්‍ය)

| | |
|---|---|
| 3. වෛද්‍ය නිලධාරි | 20 |
| 4. දන්ත ශෛල්‍ය වෛද්‍ය | 01 |
| 5. ලියාපදිංචි වෛද්‍ය නිලධාරි | 03 |
| 6. පරිපූරක වෛද්‍ය කාර්ය මඩුල්ල | 13 |
| 7. හෙද සොයුරිය | 01 |
| 8. හෙද නිලධාරි | 64 |
| 9. ලිපිකරු හා ආශ්‍රිත ශ්‍රේණි | 09 |
| 10. ආහාර භාරකාරිනී | 01 |
| 11. වෛද්‍ය වාර්තා සහකාර | 01 |
| 12. විදුලි ශිල්පී | 01 |
| 13. කෝකී | 02 |
| 14. නඩත්තු කම්කරු | 03 |
| 15. රියදුරු | 03 |
| 16. සෞඛ්‍ය කාර්ය සහායක | 58 |
| 17. ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක | 09 |
| එකතුව | **195 + 05** බාහිර විශේෂඥ |

## B. **2015** වසරේ බඳවාගැනීම්

| | |
|---|---|
| 1. **කායික වෛද්‍ය විශේෂඥ** | 01 |
| 2. වෛද්‍ය නිලධාරි | 03 |
| 3. ලියාපදිංචි වෛද්‍ය නිලධාරි | 01 |
| 4. හෙද සොයුරිය | 01 |
| 5. සාත්තු සේවිකා නිලධාරි | 07 |
| 6. සෞඛ්‍ය කළමනාකරන සහායක | 04 |
| 7. සූපවේදී | 01 |
| 8. සෞඛ්‍ය කාර්ය සහායක | 06 |
| එකතුව | 24 |

**C.** ඉල්ලා අස්වීම් හා විශ්‍රාමයෑම් - 2015 වසර තුල

ඉල්ලා අස්වීම්

| කාණ්ඩය | | හේතුව |
| --- | --- | --- |
| හෙද සොයුරිය | 01 | පුද්ගලික |

විශ්‍රාමයෑම්

| කාණ්ඩය | | හේතුව |
| --- | --- | --- |
| හෙද සොයුරිය | 02 | පුද්ගලික |

**D.** සේවය හැරයාම්

| කාණ්ඩය | | හේතුව |
| --- | --- | --- |
| හෙද සොයුරිය | 01 | පුද්ගලික |
| සෞඛ්‍ය කාර්ය සහායක | 02 | පුද්ගලික |

සේවක පුහුණුව

- ❖ බින්තුරේඛණ ශිල්පී සිසුවෙකු තෝරා සෞඛ්‍ය අමාත්‍යාංශයේ බින්තුරේඛණ ශිල්පී පුහුණු පාසලේ වසරක පුහුණුව 2015 ජුනි 08 සිට ලබා දෙන ලදී.

වෛද්‍ය නිලධාරීන් සඳහා වන විශේෂ පුහුණුව

- ❖ M.D. (Ophthal.) හි පළමුවන කොටස සමත් වූ වෛද්‍ය නිලධාරියෙකු අක්ෂි රෝග පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය වෙත මුදා හැරිනි.
- ❖ එක්සත් රාජධානියේ විදේශය පුහුණුව ලබමින් M.D. වෛද්‍ය 2 වන කොටස සම්පූර්ණ කළ වෛද්‍ය ජී.එන්.ඩී. දිසානායක මහතා විශේෂඥ වෛද්‍ය තනතුරට සුදුසුකම් ලබා ඇත.

# ආරෝග්‍යශාලාවෙන් ලබා දෙන සේවා පිළිබඳ විශ්ලේෂනය

## ලබා දෙන සේවා පිළිබඳ සාරාංශය

රෝගීන් අතින් ගත් කළ, ලබා දෙන සේවය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැක. ඒ බාහිර රෝගී අංශය සහ නේවාසික රෝගී අංශය ලෙසින්ය. (පිළිවෙලින් මූලික සෞඛ්‍ය සේවා හා තෘතීය සෞඛ්‍ය සේවා)

බාහිර රෝගී සේවා අංශය තුල බාහිර ප්‍රතිකාර, ETU ප්‍රතිකාර ඒකකය හා සායන ඇතුළත් වේ.

නේවාසික ප්‍රතිකාර අංශය මගින් ප්‍රතිකාර සහ පරීක්ෂණ කළ යුතුව ඇති රෝගීන් ඇතුත් කර ගැනීම සිදු වේ.

## සාමාන්‍ය රෝගීන් ඇතුලත් කර ගැනීම්

සෘජු ඇතුළත් කර ගැනීම් බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය හෝ සායන මගින් සිදු කෙරේ. වෛද්‍ය ගැටළු, සැක්කම් අවශ්‍යතා හා අක්ෂි ගැටලු සහිත රෝගීන් අදාල වාට්ටු වලට ඇතුළත් කර පරීක්ෂණ පවත්වා ප්‍රතිකාර ලබා දේ. එම්ආර්, සීටී ස්කෑන් වැනි විශේෂ පරීක්ෂණ අවශ්‍ය වන රෝගීන්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල හෝ පුද්ගලික අංශය වෙත යොමු කෙරේ.

විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර අවශ්‍ය වන රෝගීන් අවශ්‍යතාවය පරිදි වෙනත් රෝහල් වල අදාළ විශේෂඥ වෛද්‍යවරුන් වෙත යොමු කෙරේ. මෙම රෝහලේ නොමැති වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය කරන බරපතල ගණයේ රෝගීන් එම පහසුකම් සහිත ආසන්නව ඇති රෝහල් වෙත යොමු කෙරේ.

## වෛද්‍ය ඒකකය ලබා දුන් සේවා

තෘතියික ප්‍රතිකාර ඇතුළු නේවාසික ප්‍රතිකාර සාමාන්‍ය බාහිර ප්‍රතිකාර ඒකකය, හදිසි ප්‍රතිකාර ඒකකය, සායන හා යොමු කිරීම් හරහා වන විශේෂිත නොවන සාමාන්‍ය රෝගී ඇතුළත් කිරීම් සඳහා ලබා දෙනු ලැබේ.


සාමාන්‍ය වෛද්‍ය කණ්ඩායම අදාල පහසුකම් සහිත යොමු කෙරෙන පශ්චාත් ප්‍රතිකාර මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධව කටයුතු කෙරේ.

වෛද්‍ය ඒකකය මගින් රෝහලේ අනෙකුත් විශේෂඥ ඒකක වලට අවශ්‍ය සාමාන්‍ය වෛද්‍ය සහාය ලබා දේ.

# ආංශික විමර්ශනය :

## ○ බාහිර රෝගී ඒකකය →

- ✓ දිනකට සාමාන්‍යයක් ලෙස රෝගීන් **379** දෙනෙකු ප්‍රතිකාර සඳහා බාහිර රෝගී ඒකකයට පැමිණේ.
- ✓ **2015** වසර තුල බාහිර රෝගී අංශයට පැමිණි මුළු රෝගී සංඛ්‍යාව **138,194** ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව රෝගීන් **1,778** කට වැඩි ප්‍රමාණයකට ප්‍රතිකාර ලබා දී ඇත.





- ✓ ප්‍රධාන මාර්ගයේ කදාන සිට කුරන දක්වාත් අභ්‍යන්තරිකව මිනුවන්ගොඩ දක්වාත් හා කටුනායක අපනයන සැකසුම් කලාපයේ සේවකයන් විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ප්‍රතිකාර ලබා ගෙන ඇත.
- ✓ ප්‍රමාණවත් වෛද්‍ය කාර්ය මණ්ඩය නොමැතිවීම මෙම වසරේ බාධකයක් ලෙස හදුනා ගෙන ඇත.

## ○ හදිසි ප්‍රතිකාර ඒකකය →


- පැය විසි හතර පුරා සේවාවක් රෝගීන්ට ලබා දේ. හදිසි අනතුරු, ශෛල්‍ය වෛද්‍ය, ප්‍රතිකාර, මාර්ග අනතුරු, කාර්මික අනතුරු සහ ගෘහමය අනතුරු ඇතුළුව ඕනෑම අවස්ථාවන්ට අදාලව ප්‍රතිකාර කෙරේ. කටුනායක අපනයන සැකසුම් කලාපයේ සිදුවන කර්මාන්තශාලා හදිසි අනතුරු ලබන්නන් ප්‍රතිකාර සඳහා හදිසි අනතුරු අංශය වෙත රැගෙන ඒම සිදුවේ. දැඩි අනතුරු තත්වයන් පාලනය කර වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර අවශ්‍ය වන රෝගීන් අභ්‍යන්තර වෛද්‍යවරු විසින් ප්‍රතිකාර කරනු ලැබේ. සැත්කම්, ළමා රෝග හා වෙනත් වෛද්‍යමය නොවන සිදුවීම් වලට භාජනය වූවන් විශේෂ ප්‍රතිකාර සඳහා අසල ඇති රෝහල් වෙතට යැවේ. වෛද්‍යවරුන් ප්‍රමාණවත්ව සිටින බැවින් වෛද්‍ය වාට්ටු ප්‍රතිකාර ලබා දීමට දින කිහිපයකට පෙර අවශ්‍ය රෝගීන් දැඩි රැකවරණ සත්කාර මෙම ඒකකය මගින් ලබා දෙනු ලැබේ. උදාහරනයක් ලෙස, හදවත් රෝග, දැඩි ස්වසන ආබාධ, ජීවිත තර්ජනයට ලක් ව ඇති නියුමෝනියා රෝගීන් රෝහල තුල H.D.U නොමැති බැවින් වඩාත් සමීප සුපරීක්ෂාව සඳහා E.T.U හි රඳවා තබා ගනු ලැබේ.

2015 වසර තුල හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් වූ සමස්ත රෝගීන් සංඛ්‍යාව 21,232 ක් විය.




○ සායන →

- ✓ වෛද්‍ය සායන, සැත්කම් සායන, ළමා සායන, දියවැඩියාව හා අධික රුධිර පීඩන සායනය, අක්ෂි සායනය, මානසික වෛද්‍ය සායනය, සුවනාරී හා පවුල් සැළසුම් සායනය, දන්ත සායන හා සංක්‍රමනය නොවන රෝග සායන (**NCD** සායනය) පැවැත්වේ. වෛද්‍ය සායනය, සැත්කම් සායනය, ළමා රෝග සායනය හා අක්ෂි සායනය විශේෂඥයන්ගේ අවධානය යටතේ සිදු කෙරේ. අනෙකුත් සායන ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරෙනු ලැබේ.
- ✓ 2015 වසර තුල සියළුම සායන වලට සහභාගී වූ සමස්ත රෝගීන් සංඛ්‍යාව 122,935 ක් විය.





○ <u>දන්ත ඒකකය</u> →

- ✓ සාමාන්‍ය දන්ත ආබාධ සඳහා දන්ත සායන සෑම සතියේ සෑම දිනකම පැවැත්වේ.
  පාසැල් දන්ත සායනය සෑම සෙනසුරාදා දිනකම පැවැත්වේ.

  දත් ගැලවීම්, දත් පිරවීම්, ආකති, Periodontal ප්‍රතිකාර, විදුරුමස් සම්බන්ධ ගැටලු, සුළු සැත්කම් සිදු කිරීම වැනි හදිසි දන්ත ගැටලු වලට ප්‍රතිකාර හා සායන වල සාමාන්‍ය පරීක්ෂා කිරීම් සිදුවේ.

  මෙහි සිදු කරන සුළු මුඛ සැත්කම් අතර mucosa, හානි වූ 3 වන හක්කේ දත් ඉවත් කිරීම, හානිවූ රදනක ඉවත් කිරීම සිදු කෙරේ.

| ප්‍රතිකාර | ප්‍රතිකාර ලද රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| දත් ගැලවීම් | 3,461 |
| දත් පිරවීම් | |
| - ස්ථාවර පිරවීම් | 1,147 |
| - තාවකාලික පිරවීම් | 613 |
| දන්ත සුද්ද කිරීම් | 184 |
| වෙනත් | 2,829 |
| සායනයට සහභාගී වූ දන්ත ගැටලු සහිත රෝගීන් මුළු ප්‍රමාණය | **8,234** |





✓ මුඛ අලංකරන ප්‍රතිකාර සායන වලදී සිදු කෙරේ. වර්ණ ප්‍රතිනිර්මාණික ප්‍රතිකාර, ඉදිරියට නෙරා ඇති දත් සැකසීම හා පසු පසට නෙරා ඇති දත් සඳහා GIC පිරවීම සිදු කෙරේ. ඉදිරියට නෙරා ගොස් ඇති දත් සඳහා නියි ස්ථාපන කිරීමේ ප්‍රතිකාර ද ලබා දේ.

## ○ නේවාසික රෝගීන් →

✓ ඇඳන් 164 කින් යුතු වාට්ටු 05 ක් ඇත. මේ අතර ඇඳන් 88 ක් අක්ෂි ඒකකය සඳහා වෙන් කර ඇත.


✓ 2015 වසර තුල වාට්ටු වලට ඇතුලත වූ සමස්ත රෝගීන් සංඛ්‍යාව 17,620 කි.



## ○ සිදුකළ සැත්කම් →

- ✓ සාමාන්‍ය සැත්කම්
- ✓ කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෘත්තීය ඒකකයේ වෛද්‍ය නිලධාරීන්ගේ සහාය ඇතිව සැත්කම් (මධ්‍යම හා සුළු) සිදු කෙරිනි.
- ✓ 2015 වසර තුල සිදු කළ සැත්කම් (චක්ෂු හා සාමාන්‍ය සැත්කම්) මුළු සංඛ්‍යාව 13,677 ක් විය.
- ✓ සියළුම වර්ගවල සැත්කම් සඳහා සාමාන්‍ය රෝහල් ගාස්තුවක් අය කෙරේ.

අඩ වරප්‍රසාදිත රෝගීන් සඳහා රෝහල් ගාස්තුව අඩුම කිරීමේ පහසුකම සළසා ඇත.




## ○ තුවාල ප්‍රතිකාර ඒකකය →

ගත වූ වසර තුනෙහි තුවාල ප්‍රතිකාර ඒකකයේ සංඛ්‍යාලේඛන

| වසර | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| 2012 | 1,162 |
| 2013 | 6,071 |
| 2014 | 14,483 |
| 2015 | 23,114 |

මෙම අංශය තුල වූ රෝගීන් සංඛ්‍යාව දැඩි ලෙස වර්ධනය වී ඇති බව පෙනේ. රෝහලේ තුවාල ප්‍රතිකාර ඒකකය දිවයිනේම ජනප්‍රියතාවය දිනා ගෙන ඇති අතර දුර බැහැර ප්‍රදේශ වලින් මෙම රෝහල වෙත රෝගීන් යොමු කෙරේ.


1. නේවාසික වූ නව රෝගීන් සංඛ්‍යාව 690
2. සහභාගී වූ රෝගීන් සංඛ්‍යාව 23,114
3. ප්‍රතිකාර ලබා පිටව ගිය සංඛ්‍යාව 285
4. දෛනික පැමිණීම්වල සාමාන්‍යය 74

නිර්වින්දනය යටතේ සුළු ශල්‍යකර්ම සිදු කළ යුතු රෝගීන්ට රෝහල තුලම ප්‍රතිකාර කෙරෙන අතර ශල්‍යාගාර තුල බරපතල සැත්කම් කළ යුතු රෝගීන් අසල ඇති උතුරු කොළඹ ශික්ෂණ රෝහල, මීගමුව දිස්ත්‍රික් මහා රෝහල, කොළඹ ජාතික රෝහල වෙත යොමු කරන අතර, එම ප්‍රතිකාර අවසන් වූ වහාම නැවත ඒකකයට යොමු කෙරේ.

රෝහලට සම්බන්ධ බාහිර විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයාගෙන් ශෛල්‍යකර්ම උපදේශ ලබා ගනු ලැබේ.

තුවාළ සුව කිරීමට අදාළ කාර්ය මණ්ඩලය පුහුණුව හා දැනුවත් කිරීම දියත් කර ඇත. සාත්තු සේවික නිලධාරීන් හා වෛද්‍ය නිලධාරීන් කම පුහුණුව මෙම ඒකකය මගින් ලබා ගැනේ.

මෙම තුවාල ඒකකය තුල නේවාසික රෝගීන් සිටින බැවින් වෙනත් රෝහල් වල තුවාල ප්‍රතිකාර වලට වඩා වෙනස් වේ.





✓ 2015 වසර තුල තුවාල ප්‍රතිකාර ඒකකය තුල ප්‍රතිකාර කළ සමස්ත රෝගීන් සංඛ්‍යාව 23,114 ක් විය.

## ○ <u>රසායනාගාර පරීක්ෂණ</u> →

මූලික රසායනාගාර සේවා සිදු කර දෙනු ලැබේ. පහත සඳහන් ප්‍රධාන රසායනාගාර පරීක්ෂණ මූලික රසායනාගාර සේවා වලට අමතරව 2015 වසරේ දී ආරම්භ කෙරිනි.


- Serum Electrolytes
- Troponin I
- C. Reactive Proteins - CRP (ප්‍රමාණාත්මක)

✓ 2015 වසර තුල සිදු කළ රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 57,138 ක් විය.




○ <u>ඊසීජී</u> →

✓ 2015 වසර තුල ලබා ගත් E.C.G. ප්‍රමාණය 3,014 ක් විය.




○ <u>එක්ස්-කිරණ ගැනීම්</u>

✓ 2015 වසර තුල ගත් එක්ස් රේ ප්‍රමාණය **5,505** ක් විය.



# අක්ෂි රෝග ඒකකය

## අක්ෂි ප්‍රතිකාර ඒකකය විසින් ලබා දෙන සේවා

- දෛනික සායන
- 24 පැයේ තුවාල ප්‍රතිකාර සේවය
- අක්ෂි රෝග පරීක්ෂණ
- අක්ෂිමය සැත්කම්
- ලේසර් ප්‍රතිකාර
- නේවාසික රෝගී කළමනාකරණය
- අක්ෂි කඳවුරු පැවැත්වීම

## අක්ෂි ඒකකයේ කාර්යසාධන සාරාංශය

| කාර්යය | | 2015 හි කාර්යසාධනය |
|---|---|---|
| ඇතුළත් කර ගැනීම් | ⟶ | 13,632 |
| සැත්කම් සංඛ්‍යාව | ⟶ | 11,341 |
| සායනික රෝගීන් සංඛ්‍යාව | ⟶ | 72,559 |
| ලේසර් ප්‍රතිකාර ප්‍රමාණය | ⟶ | 1,984 |
| කණ්නාඩි ප්‍රතිකාර ප්‍රමාණය | ⟶ | 15,258 |
| ඇදිසි රෝග ප්‍රතිකාර ප්‍රමාණය | ⟶ | 2,494 |
| අක්ෂි කඳවුරු රෝගීන් සංඛ්‍යාව | ⟶ | 1,891 |

## සායන

- ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල හැර අන් සෑම දිනකම පැවැත්වේ.
- කලින් වේලාව වෙන් කර ගැනීමක් අවශ්‍ය නොවන අතර රෝගීන්ට සෘජුවම පැමිණ රෝග පරීක්ෂාව සිදු කර ගත හැක.
- කිසිදු රෝගී සීමාවක් පනවා නොමැත.
- පහත සඳහන් සායන පැවැත්වේ.
  - ✓ සාමාන්‍ය අක්ෂි සායනය
  - ✓ දියවැඩියා සායනය
  - ✓ ග්ලූකෝමා සායනය
  - ✓ ළමා සායනය
  - ✓ පශ්චාත් සැත්කම් සායනය
  - ✓

## අක්ෂි සැත්කම්

ඒකකය තුල පහත සඳහන් වර්ග වල අක්ෂි සැත්කම් සිදු කරනු ලබයි.

i. ඉදිරිපස කොටසෙ ශල්‍යකර්ම
ii. දෘෂ්ඨි විතානය යාබද පසුබාගයේ සැත්කම්
iii. අක්ෂි කුහරය ආශ්‍රිත සැත්කම්
iv. ග්ලූකෝමා ආශ්‍රිත සැත්කම්
v. ඇසට බාහිරින් සිදු කරන සැත්කම්

සැත්කම් ප්‍රතිකාර තදබදය එතරම් ගැටලුවක් නොවන අතර අවශ්‍ය පුද්ගලයන්ට සායන වලට පැමිණෙන දිනම සැත්කම් කර ගැනීමට අවස්ථාව ඇත. උදා - සුද මතුවීම නිසා සුවකල හැකි අන්ධතාවය.

**සිදුකළ සැත්කම් සංඛ්‍යාව**

| සැත්කම් වර්ග | රෝගීන් සංඛ්‍යාව 2015 |
|---|---|
| ඉදිරිපස කොටසේ සැත්කම් | 9,969 |
| දියවැඩියා සැත්කම් | 70 |
| දෘෂ්ඨිවිතානය ආශ්‍රිත සැත්කම් | 276 |
| වෙනත් සැත්කම් | 1,026 |
| සායනයේ සිදුකළ සුළු සැත්කම් | 243 |
| එකතුව | **11,584** |

## ලේසර් ප්‍රතිකාර

පහත දැක්වෙන වර්ගයේ සියළු ලේසර් ප්‍රතිකාර සිදු කර ඇත.

i. YAG capsulotomy
ii. YAG PI
iii. Pan Retinal Laser Photo coagulation (PRP)
iv. Focal ලේසර් ප්‍රතිකාරය (FLT)
v. Peripheral ලේසර්
vi. Grid ලේසර්
vii. Barrier ලේසර්
viii. Lid ලේසර්

ලේසර් ප්‍රතිකාර මගින් විශාල වර්ගයේ දියවැඩියා හා ග්ලූකෝමා තත්ව පාලනය කිරිමට අපට හැකි විය. ලේසර් රෝගීන් වැඩි සංඛ්‍යාවක් සායනයට පැමිණි දිනම ලේසර් ප්‍රතිකාර ලබා දේ.

**2015 වසරේ සිදු කළ ලේසර් ප්‍රතිකාර මුළු ප්‍රමාණය**

| ලේසර් වර්ගය | සිදුකළ සංඛ්‍යාව |
|---|---|
| PRP | 229 |
| FLT | 326 |
| YAG Capsulotomy | 1,307 |
| Yag PI | 53 |
| වෙනත් | 69 |
| එකතුව | **1,984** |

## නේවාසික රෝගී කළමනාකරණය

වාට්ටුවේ ඇති ඇඳන් සංඛ්‍යාව ඉක්මවා වූ සැත්කම් ප්‍රමාණයක් සිදු කළ ද, දුර බැහැර ප්‍රදේශ වලින් පැමිණෙන රෝගීන් වැඩි ප්‍රමාණයක් දින සැතකම් ලෙස හඳුන්වන සැත්කම් එදිනම සිදු කර පිට කෙරේ. එබැවින් ඇඳන් 88 ක් සහිතව කටයුතු කර ගෙන යාමට බාධාවක් කර ගෙන නොමැත.

| | 2015 |
|---|---|
| ඇතුළත් කළ රෝගී සංඛ්‍යාව | 17,620 |

## අක්ෂි ඌනතා ආශ්‍රිත සේවා - 2015

| | 2015 |
|---|---|
| අක්ෂි ඌනතා සුව කළ සංඛ්‍යාව | 15,258 |

| | 2015 |
|---|---|
| H.V.F. රෝගීන් | 303 |
| P.M.T. රෝගීන් | 1,107 |
| පශ්චාත් සැත්කම් රෝගීන් | 1,559 |
| OCT | 1,832 |
| එකතුව | **4,801** |

## අක්ෂි කදවුරු

දිවයින පුරා කලින් පවත්වන අක්ෂි කඳවුරු වලින් හදුනා ගන්නා රෝගීන් සැත්කම්, ලේසර් ප්‍රතිකාර හෝ වෙනත් පරීක්ෂණ හා ප්‍රතිකාර සඳහා විජය කුමාරතුංග අනුස්මරන රෝහල වෙත යොමු කෙරේ. අපගේ සායන වලදී පසු විපරම් පිරික්සුම් සිදු කෙරේ. (උදා - ග්ලූකෝමා)

අක්ෂි කාච මිලදී ගැනීමට අපහසු රෝගීන් සඳහා සැත්කම් නොමිලයේ සිදු කර විවිධ දානපතියන් වෙතින් රෝහලට නොමිලයේ ලබා දෙන කාච සවි කෙරේ.

## අක්ෂි රෝග සම්බන්ධ පරීක්ෂණ

පහත දැක්වෙන අක්ෂි රෝග පරීක්ෂණ රෝහල තුල සිදු කෙරේ.

- Fundus Fluorescein Angiography
- Anterior Segment Photography,
- HVF (Humphrey visual field) පරීක්ෂනය,
- ස්කෑන් / සිටි biometry,
- B ස්කෑන්,
- OCT ( Optical Coherence Tomography ) Disc and Macula,
- Corneal Topography,
- Fundal Photography

**<u>සුද මතුවීම නිසා වූ අන්ධතාවය දුරු කිරීමට කළ මෙහෙය</u>**

දිවයිනේ සංවර්ධනය නොවූ පළාත් වල මහා පරිමාණ සැත්කම් සිදු කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂන් 2020 සහාය ඇතිව මෙම ජාතික වැඩසටහනට අප දායක වන්නෙමු.

නොමිලේ කාච ලබා දීම ඇතුළුව රෝහල් ගාස්තු යනාදිය නොමැතිව අව වරප්‍රසාදිත රෝගීන් හට නොමිලයේ සේවාවක් රෝහල සපයනු ලැබේ.

සේවා ලබා දුන් ප්‍රදේශ පහත දක්වා ඇත.

| | |
|---|---|
| කහවත්ත | 156 |
| කොළොන්න | 224 |
| බලන්ගොඩ | 149 |
| ඇහැලියගොඩ | 243 |
| කලවාන | 147 |
| දැරණියගල | 65 |
| රඹුක්කන | 390 |
| සූරියවැව | 334 |
| දික්ඔය | 50 |
| නෙලුව | 06 |
| නුවරඑළිය | 312 |
| තලවාකැලේ | 39 |
| මීගමුව | 35 |
| රාගම | 34 |
| ආනමඩුව | 40 |
| කොළඹ | 33 |
| සීදුව හා ආසන්න ප්‍රදේශ | 230 |
| | 2,487 |

නොමිලේ කාච හා රෝහල් ගාස්තු අය නොකළ මුළු අවස්ථා සංඛ්‍යාව

# පර්යේෂණ හා ප්‍රකාශන

✓ 2015 වර්ෂය තුල ඇඳන් භාවිතා කිරීමේ අනුපාතය **65.65%** ක් විය.

✓ 2015 **Morbidity** පහත දක්වා ඇත.-

වඩාත් පොදුවේ දක්නට ඇති රෝග වැලඳී ඇති තත්වයන් අනුපිළිවෙලට පහත දක්වා ඇත.

1. යුද මතුවීම හා කාවයේ වෙනත් රෝග
2. ඇසේ වෙනත ආබාධ හා adnexa
3. Diabetes Mellitus
4. වයිරස් උන ඇතුළුව වයිරස් රෝග
5. Bronchial ඇදුම රෝගය
6. Hypertension
7. Gastro enteritis
8. තුවාල ඇතුළුව සංඝේ රෝග
9. මෛත්‍ර ලිංගික පද්ධතිය ආශ්‍රිත රෝග

➢ මාරාන්තික රෝග

1. Septicemia
2. Ischemic හෘදවත් රෝග හා Myocardial infarction
3. හෘද රෝග
4. Pneumonia

✓ විශේෂ අවස්ථා

✓ වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය 2015 පෙබරවාරි 16 දින පැවැත්විනි.

✓ ඒකක භාර ප්‍රධානීන්ගේ රැස්වීම් අවශ්‍යතාවය පරිදි සහ එදිනෙදා මතුවන ගැටලු සාකච්ඡාවට ලක් කෙරිනි.

✓ අවශ්‍ය හැගෙන අවස්ථාවල කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වන ලදී.

➢ ආගමික කටයුතු

✓ වෙසක් බන හා පොසොන් දන්සැල පැවැත්වූ අතර නත්තල් සැමරුම් ද සිදු කෙරිනි.

➢ වෙනත් අදාළ කරුණු

✓ කිසිදු මහා පරිමාණ ඖෂධ හෝ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හිඟයක් නොමැත.

✓ කිසිදු ආකාරයක වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් හෝ වැඩවර්ජනයක් සිදු ව නොමැත.

✓ රෝහලට හෝ කාර්ය මණ්ඩලයට එරෙහිව කිසිදු බරපතල පැමිණිලි රෝගීන් විසින් සිදු කර නොමැත.

# 2015 වසරේ ප්‍රධාන සිදුවීම්

2015 වසර තුල පහත දැක්වෙන මිලදී ගැනීම් සිදු කෙරිනි.

## A) මිලදී ගැනීම්

### 1) වෛද්‍ය උපකරණ

වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වියදම් කළ මුළු මුදල රු. 24,583,437/- කි.

| උපකරණය | ප්‍රමාණය | මුදල (රු.) |
|---|---|---|
| Vitrectomy Machine | 01 | 10,992,856.00 |
| Non Contact Biometry System | 01 | 5,867,000.00 |
| Auto Kerato Refractometer | 01 | 2,375,000.00 |
| AB Scanner with Phacymetry | 01 | 2,550,000.00 |
| සැත්කම් තියටර් ඇඳන් | 02 | 900,000.00 |
| Defibrillators | 02 | 1,178,100.00 |
| WD 6 වාට්ටුව සඳහා සැත්කම් උපකරණ | | 173,072.00 |
| වෙනත් වෛද්‍ය උපකරණ (spinal Board, Pulse Oxymeters වැනි ) | | 547,509.00 |

පරිත්‍යාග ලෙස ලත් වෛද්‍ය උපකරණ වල වටිනාකම - රු. 377,538.98

### 2) ලී බඩු & සවිකිරීම්

ලී බඩු සඳහා වූ මුළු මුදල රු. 1,129,811.28 ක් විය.

| උපකරණ | ප්‍රමාණය | මුදල (රු.) |
|---|---|---|
| රෝහල් ඇඳන් | 20 | 472,860.00 |
| පුටු (ප්ලාස්ටික්, ලී) | 54 | 169,638.78 |
| මේස | 15 | 209,462.50 |
| ඇඳන් පැති කබඩ් | 20 | 155,000.00 |
| කබඩ් | 11 | 122,850.00 |

### 3) යන්ත්‍ර හා විදුලි උපකරණ

යන්ත්‍ර හා විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා වියදම් කළ මුළු මුදල රු. 1,370,131.48 ක් විය

| උපකරණ | ප්‍රමාණය | මුදල (රු.) |
|---|---|---|
| ශීතකරණ | 02 | 56,900.00 |
| වායු සමීකරණ යන්ත්‍ර | 07 | 854,731.22 |
| ප්‍රින්ටර්රස් | 04 | 157,500.00 |
| පරිගණක & UPS | 02 | 197,204.00 |
| වෙනත් (විදුලි කෝත්තලය, fan ,drill ) | | 103,796.26 |

පරිත්‍යාග ලෙස ලත් විදුලිමය උපකරණවල වටිනාකම - රු. 115,798.00

## B) ගොඩනැගිලි තැනීම

- 2015 පෙබරවාරි මස නිම කළ නව තෙමහල් ගොඩනැගිල්ල මහජනයාට විවෘත කෙරිනි.
- නව තෙමහල් ගොඩනැගිල්ල තැනීම සඳහා වියදම් කළ මුළු මුදල -රු. 15,0860,032.02

  ( රසායනාගාරය, තුවාල සත්කාර ඒකකය, ඖෂධ කාමර වැනි ගොඩනැගිලි පුළුල් කිරීම )
- ඖෂධ ගබඩාව ලෙස භාවිතා කිරීම සඳහා ගොඩනැගිල්ලේ කොටසක් ලබා දෙන ලදී.
- නව හයේ වාට්ටුව සැත්කම් වාට්ටුවක් ලෙස භාවිතා කිරීම සඳහා නව ගොඩනැගිල්ලේ බිම් මහලේ සැකසිනි.
- නව ගොඩනැගිල්ලේ විශේෂ සැත්කම් සායනයක් සැකීමට අවශ්‍ය සියලු කටයුතු කර ඇත.
- වෙනත් (රසායනාගාර පියස්ස ) - රු. 84,829.00

## C) පස් පිරවීම

රෝහල පිටුපස පැවති වගුරුසහිත ඉඩමක් රු .5,048,541/- ක වියදමක් දරා පස් යොදා පුරවන ලදී. මෙසේ පුරවන ලද ඉඩම මහල් හයකින් යුත් ගොඩනැගිල්ල තැනීමට වෙන් කර ඇත.

## D) අක්ෂි සායනය අලුත්වැඩියාව

අක්ෂි සායනය රු. 1,288,000/- ක වියදමකින් වැඩි පහසුකම් සහිතව අලුත්වැඩියා කෙරිනි.

- මෘත ශරීරාගාරය අලුත්වැඩියා කෙරිනි.
- තුවාල ප්‍රතිකාර ඒකකය වටා ඇති උද්‍යානය රෝගීන්ට භාවිතා කිරීම පිණිස උද්‍යාන බංකු යොදා නැවත සකස් කෙරිනි.
- සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය පවත්වාගෙන යාම සඳහා හෙද නිලධාරියෙකු පත් කෙරිනි.
- වැලිසර ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර සමඟ එක්ව ක්ෂය රෝගය සඳහා කේඩ සාම්පල පරීක්ෂණ පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇත.

# Services Rendered January to December 2015 Wijaya Kumaratunga Memorial Hospital

| Service Rendered | | January | February | March | April | May | June | July | August | September | October | November | December | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| OPD | *(No. of Patients)* | 10,056 | 10,111 | 11,504 | 9,701 | 11,687 | 13,964 | 12,616 | 10,975 | 11,082 | 12,884 | 12,083 | 11,531 | **138,194** |
| ETU | *(No. of Patients)* | 1,565 | 1,487 | 1,641 | 1,567 | 1,842 | 2,114 | 2,069 | 1,718 | 1,661 | 1,879 | 1,828 | 1,861 | **21,232** |
| CLINICS | | | | | | | | | | | | | | |
| Eye Clinics I | *(No. of Patients)* | 1,036 | 1,118 | 1,463 | 861 | 1,460 | 1,746 | 1,355 | 1,292 | 1,379 | 1,482 | 1,038 | 1,151 | 15,381 |
| Eye Clinics II | *(No. of Patients)* | 4,453 | 4,722 | 4,417 | 3,216 | 4,744 | 5,917 | 5,285 | 5,040 | 4,978 | 4,624 | 5,126 | 4,656 | 57,178 |
| Dental | *(No. of Treatments)* | 649 | 594 | 756 | 575 | 706 | 763 | 891 | 820 | 618 | 661 | 489 | 712 | 8,234 |
| Medical | *(No. of Patients)* | 2,788 | 2,575 | 2,737 | 2,561 | 2,714 | 2,972 | 3,052 | 3,077 | 2,863 | 3,287 | 3,215 | 2,922 | 34,763 |
| Diabetes/ Hypertension | *(No. of Patients)* | 194 | 201 | 209 | 243 | 207 | 224 | 234 | 205 | 287 | 222 | 161 | 302 | 2,689 |
| Surgical | *(No. of Patients)* | 54 | 46 | 53 | 44 | 52 | 62 | 45 | 71 | 63 | 76 | 87 | 94 | 747 |
| Peadiatric | *(No. of Patients)* | 96 | 95 | 178 | 74 | 117 | 151 | 155 | 87 | 117 | 80 | 86 | 119 | 1,355 |
| Psychiatric | *(No. of Patients)* | 163 | 159 | 209 | 208 | 189 | 187 | 169 | 195 | 185 | 184 | 218 | 186 | 2,252 |
| Family Planing | *(No. of Patients)* | 4 | 5 | 2 | 2 | 5 | 8 | 7 | 2 | 2 | - | - | - | 37 |
| Well Women Clinic | *(No. of Patients)* | 5 | 25 | 23 | 2 | 13 | 3 | 22 | 17 | 6 | - | - | - | 116 |
| Wound Care Unit | *(No. of Patients)* | 1,608 | 1,566 | 1,915 | 1,956 | 2,061 | 2,135 | 2,095 | 1,861 | 1,742 | 2,027 | 1,989 | 2,159 | 23,114 |
| NCD Clinic | *(No. of Patients)* | - | - | - | - | - | - | - | 31 | 40 | 44 | 37 | 31 | 183 |
| In Patients | | | | | | | | | | | | | | - |
| Ward 01 | *(No. of Admissions)* | 128 | 120 | 136 | 130 | 156 | 183 | 153 | 127 | 149 | 149 | 130 | 98 | 1,659 |
| Ward 02 | *(No. of Admissions)* | 139 | 121 | 145 | 151 | 196 | 227 | 220 | 157 | 153 | 180 | 187 | 152 | 2,028 |
| Ward 03 | *(No. of Admissions)* | 450 | 454 | 572 | 378 | 471 | 454 | 457 | 460 | 431 | 529 | 566 | 354 | 5,576 |
| Ward 04 | *(No. of Admissions)* | 555 | 649 | 759 | 563 | 685 | 677 | 755 | 653 | 634 | 851 | 744 | 531 | 8,056 |
| Ward 05 | *(No. of Admissions)* | 21 | 15 | 33 | 19 | 35 | 32 | 27 | 25 | 32 | 18 | 17 | 27 | 301 |
| Operations | | | | | | | | | | | | | | |
| Eye Surgeory | *(No. of Surgeories)* | 809 | 901 | 1,110 | 784 | 978 | 942 | 1,030 | 926 | 905 | 1,162 | 1,048 | 746 | 11,341 |
| Minor eye surg (Done in Clinic) | *(No. of Surg.)* | 19 | 23 | 26 | 16 | 19 | 17 | 23 | 20 | 26 | 22 | 20 | 12 | 243 |
| General Surgeory | *(No. of Surgeories)* | 7 | 4 | 6 | 5 | 5 | 10 | 6 | 12 | 11 | 11 | 16 | 16 | 109 |
| Laser Treatment | *(No. of Patients)* | 168 | 192 | 165 | 166 | 159 | 133 | 150 | 159 | 175 | 192 | 162 | 163 | 1,984 |
| Refraction Service | *(No. of Patients)* | 1,642 | 1,528 | 1,591 | 1,035 | 1,229 | 1,271 | 1,141 | 1,372 | 1,336 | 1,200 | 778 | 1,135 | 15,258 |
| Investigation :- HVF | *(No. of Patients)* | 32 | 30 | 24 | 22 | 28 | 39 | 31 | 8 | 20 | 25 | 20 | 24 | 303 |
| OCT | *(No. of Patients)* | 103 | 127 | 143 | 150 | 191 | 202 | 169 | 87 | 187 | 227 | 164 | 82 | 1,832 |
| LAB | *(No. of Tests)* | 4,457 | 4,714 | 5,317 | 3,986 | 4,649 | 5,299 | 5,184 | 5,026 | 4,877 | 4,765 | 4,487 | 4,377 | 57,138 |
| X-Ray | *(No. of X- Rays)* | 423 | 435 | 532 | 378 | 491 | 586 | 492 | 427 | 449 | 455 | 444 | 393 | 5,505 |

## එක් රෝගියෙකු සඳහා වන ඒකක පිරිවැය

2015 වසරේ මුළු වියදමින් සමස්ත රෝගී දින සංඛ්‍යාවෙන් බෙදීමෙන් හා පැමිණි බාහිර රෝගීන් සංඛ්‍යාව හයෙන් බෙදීමෙන් මෙය සකසා ඇත.

| | | |
|---|---|---|
| වසරේ මුළු වියදම | = | (රු.) 273,524,255.03 |
| මුළු රෝගී දින සංඛ්‍යාව | = | 30,931 |
| බාහිර රෝගී මුළු සංඛ්‍යාව | = | 305,495 |
| බාහිර රෝගීන් 6 = අභ්‍යන්තර රෝගී පැමිණීම 1 | = | 305,495/ 6 |
| | = | 50,915 |
| රෝගී දින මුලු ප්‍රමාණය | = | 30,931 + 50,915 |
| | = | 81,846 |
| රෝගියෙකුගේ දිනක පිරිවැය | = | 273,524,255.03 / 81,846 |
| | = | 3,341 |

# විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

## මූල්‍ය තත්වය ප්‍රකාශනය

### 2015 දෙසැම්බර් 31 දිනට

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 1 | 13,047,074.19 | 2,884,616.87 |
| ලැබීමට නියමිත දෑ/උපචිත ලැබීම් | 2 | 8,965,013.00 | 8,046,476.00 |
| තොග | 3 | 20,464,464.95 | 11,670,827.31 |
| පූර්ව ගෙවීම් | 4 | 319,186.05 | 683,617.85 |
| | | 42,795,738.19 | 23,285,538.03 |
| ප්‍රාග්ධන කාරක ප්‍රගතිය | 5 | 180,000.00 | 11,836,109.07 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 64,265,561.26 | 56,219,606.03 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7 | 171,238,530.78 | 150,477,429.59 |
| | | 235,504,092.04 | 206,697,035.62 |
| මුළු වත්කම් | | 278,479,830.23 | 241,818,682.72 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවීමට ඇති දෑ | 8 | 8,263,979.56 | 4,524,559.76 |
| ණයගැතියෝ | 9 | 37,424,718.74 | 21,122,172.63 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 10 | 30,070,612.79 | 21,420,375.65 |
| සමස්ත බැරකම් | | 75,759,311.09 | 47,067,108.04 |
| ශුද්ධ වත්කම් | | **202,720,519.14** | **194,751,574.68** |

ශුද්ධ වත්කම්/ ස්කන්ධය

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 11 | 75,787,890.44 | 75,787,890.44 |
| රාජ්‍යප්‍රදාන - ප්‍රාග්ධන | 12 | 172,698,428.14 | 145,722,742.32 |
| පරිත්‍යාග | 19 | 1,861,114.53 | 1,323,877.55 |
| සංචිත - ප්‍රාග්ධන වාසි | | 2,131,366.30 | 2,131,366.30 |
| සමුච්චිත අතිරික්තය/ (හිඟ) | 13 | (49,758,280.27) | (30,214,301.93) |
| **ශුද්ධ වත්කම්/ සමකොටස් එකතුව** | | **202,720,519,14** | **194,751,574.68** |

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩය වෙනුවෙන් අත්සන් කරන ලදී.

.......................................

සභාපති

දිනය :

.......................................

අධ්‍යක්ෂ

දිනය :

.......................................

අධ්‍යක්ෂ

දිනය :

.......................................

ගණකාධිකාරි

දිනය :

# විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
### 2015 දෙසැම්බර් 31 දින අවසන් වන වර්ෂය සඳහා

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **ආදායම්** | | රු. | රු. |
| රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන) | | 209,000,000.00 | 180,000,000.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | | 23,024,314.18 | 18,808,340.93 |
| වෙනත් ආදායම් | 14 | 21,476,057.13 | 22,347,130.97 |
| සමස්ත ආදායම | | 253,500,371.31 | 221,155,471.90 |
| **වියදම්** | | | |
| කුලී වැටුප් හා සේවක සුභසාධන | 15 | 148,331,817.76 | 108,795,344.54 |
| සැපයුම් හා භාවිත දෑ | 16 | 70,331,120.86 | 57,765,837.71 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම | 17 | 23,102,512.73 | 18,929,389.87 |
| වෙනත් වියදම් | 18 | 31,758,803.68 | 32,106,881.68 |
| සමස්ත වියදම් | | 273,524,255.03 | 217,597,453.80 |
| **අතිරික්තය / (හිග) අදාල කාලයේ** | | **(20,023,883.72)** | **3,558,018.10** |

# විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - 2015 දෙසැම්බර් 31අවසන් වන වර්ෂය සඳහා

මුල්‍ය ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්

| | |
|---|---|
| අතිරික්තය / (හිග) | (20,023,883.72) |
| මුදල්නොවන මාර්ග | |
| ක්ෂය | 23,102,512.73 |
| ක්‍රමක්ෂය - රාජ්‍ය ප්‍රදාන | (23,024,214.18) |
| වැඩිවීම - ගෙවීමට ඇති දෑ | 3,739,419.80 |
| වැඩිවීම - ණයගැතියෝ | 16,302,546.11 |
| වැඩිවීම - තොග | (8,793,637.64) |
| වැඩිවීම - සේවක පිරිවැයට අදාල ප්‍රතිපාදන | 4,378,954.78 |
| වැඩිවීම - පූර්ව ගෙවීම් | 364,431.80 |
| වැඩිවීම - ලැබීමට නියමිත දෑ | (918,537.00) |
| අඩුවීම - පෙර වසරේ ගැලපුම් | (193,945.89) |
| විශ්‍රාම්පාරිතෝෂික බැදීම් - ගෙවූ | (124,995.00) |
| ශුද්ධ මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් | **(5,191,348.21)** |

මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් වලින්

| | |
|---|---|
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | (22,990,085.40) |
| ප්‍රාග්ධන කාරක ප්‍රගතිය | (11,656,109.07) |
| ලත් ප්‍රාග්ධන ප්‍රදාන | 50,000,000.00 |
| ශුද්ධ මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් | **15,353,805.53** |

මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්

| | |
|---|---|
| ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් | |
| ශුද්ධ වැඩිවීම / (අඩුවීම) - මුදල් හා මුදල් වලට සමානදෑ | **10,162,457.32** |
| මුදල් හ මුදල් වලට සමාන දෑ- කාලාරම්භක | **2,884,616.87** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාවසාන | **13,047,074.19** |

මුදල් ගලන ප්‍රකාශනයේ සටහන් 1

මුදල් හා මුදල් වලට සමාන දෑ

| | |
|---|---|
| | **2015** |
| බැංකුගත මුදල් | 13,027,099.19 |
| සුළු මුදල් | |
| අතැති මුදල් | 19,975.00 |
| | **13,047,074.19** |

# විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

## ස්ථාවර වත්කම් ලේඛණය - 2015 දෙසැම්බර් 31 දිනට

| අයිතමය | පිරිවැය | | | | අනුපාතය | ක්ෂය | | | | 31/12/2015 දිනට ලියාහැරි අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1/1/2015 දිනට | වසරේ එකතුවීම් | වසරේ ඉවත්කිරීම් | 31/12/2015 දිනට | | 1/1/2015 දිනට | වසරේ එකතුවීම් | වසරේ ඉවත්කිරීම් | 31/12/2015 දිනට | |
| ඉඩම් | 18,627,500.00 | 6,352,541.00 | | 24,980,041.00 | | - | - | - | - | 24,980,041.00 |
| ගොඩනැගිලි & සවිකිරීම් | 157,958,510.24 | 17,926,255.50 | | 175,884,765.74 | 2% | 26,108,580.65 | 3,517,695.31 | | 29,626,275.96 | 146,258,489.78 |
| වාහන | 17,958,792.90 | | | 17,958,792.90 | 20 % | 11,630,789.90 | 3,005,999.00 | | 14,636,788.90 | 3,322,004.00 |
| ලිබඩු, සවිකිරීම & උපකරණ | 8,831,591.97 | 1,171,311.08 | | 10,002,903.05 | 10 % | 6,922,596.82 | 528,146.66 | | 7,450,743.48 | 2,552,159.57 |
| යන්ත්‍රෝ පකරණ | 6,647,424.28 | 1,301,280.48 | | 7,948,704.76 | 15 % | 5,218,660.16 | 595,892.00 | | 5,814,552.16 | 2,134,152.60 |
| පරිසන ක | 595,182.00 | 197,204.00 | | 792,386.00 | 20 % | 416,211.40 | 104,467.20 | | 520,678.60 | 271,707.40 |
| වෛද්‍ය උපකර ණ | 139,777,047.30 | 24,960,977.09 | | 164,738,024.39 | 15 % | 93,402,174.14 | 15,350,312.56 | | 108,752,486.70 | 55,985,537.69 |
| | 350,396,048.69 | 51,909,569.15 | | 402,305,617.84 | | 143,699,013.07 | 23,102,512.73 | 0.00 | 166,801,525.80 | 235,504,092.04 |

235,504,092.(

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **මුදල් & මුදල් වලට සමාන දෑ** | 1 | | |
| බැංකුගත මුදල් | | 13,027,099.19 | 2,852,116.87 |
| සුළු මුදල් | | | 25,000.00 |
| අතැති මුදල් | | 19,975.00 | 7,500.00 |
| | | 13,047,074.19 | 2,884,616.87 |
| **ලැබීමට නියමිත** | 2 | | |
| නැන්පත් ගිණුම | | 570,000.00 | 50,000.00 |
| උත්සව අත්තිකාරම් | | 270,000.00 | 225,500.00 |
| විශේෂ අත්තිකාරම් | | - | - |
| ආපදා ණය | | 8,125,013.00 | 7,770,976.00 |
| | | 8,965,013.00 | 8,046,476.00 |
| **තොග** | 3 | | |
| ලිපිද්‍රව්‍ය | | 154,042.22 | 140,500.79 |
| ඖෂධ | | 18,642,050.23 | 10,218,755.29 |
| රසායනාගාර රසායනික ද්‍රව්‍ය | | 579,056.78 | 645,855.89 |
| රෙදි වර්ග | | 109,037.07 | 141,945.07 |
| පොදු තොග | | 223,272.33 | 295,094.54 |
| අළුත්වැඩියා & නඩත්තු | | 65,316.18 | 124,674.10 |
| එක්ස් රේ | | 691,690.14 | 104,001.63 |
| | | 20,464,464.95 | 11,670,827.31 |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **පූර්ව ගෙවීම්** | **4** | | |
| රක්ෂණ මුදල් & මාර්ගස්ථ | | - | 6,095.40 |
| රක්ෂණ - ඩබල් කැබ් - GD 2714 | | - | 3,147.97 |
| රක්ෂණ - ඩබල් කැබ් - PC 4087 | | - | 50,534.92 |
| රක්ෂණ - ගිලන් රථය HN - 6312 | | - | 36,627.21 |
| රක්ෂණ - ගිලන් රථය LW - 0961 | | - | 18,621.77 |
| සේවා ගිවිසුම - ඩිජිටල් පිටපත් යන්ත්‍රය | | - | 10,710.78 |
| බලපත්‍ර ගාස්තු GD 2714 | | - | 8,580.78 |
| බලපත්‍ර ගාස්තු PC 4087 | | - | 4,980.42 |
| සුඛෝපභෝගී බද්ද PC 4087 | | - | 5,000.00 |
| සේවා ගිවිසුම - ජ්‍රිජි A/C | | 102,890.16 | 104,865.90 |
| සේවා ගිවිසුම- විදුලි සෝපානය | | 152,500.00 | 135,164.70 |
| සේවා ගිවිසුම- විෂුවල් පිල්ඩ | | 59,725.41 | 29,288.00 |
| කුලී | | - | 270,000.00 |
| විදුලිය NO නිල නිවාස | | 4,070.48 | |
| | | 319,186.05 | 683,617.85 |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **ඉදිකිරීම් ප්‍රගතිය** | **5** | | |
| ඉදිකිරීම් ප්‍රගතිය - නව ගොඩනැගිල්ල | | - | 10,094,590.07 |
| ඉදිකිරීම් ප්‍රගතිය - වාහන නැවතුම II | | - | 437,519.00 |
| ඉදිකිරීම් ප්‍රගතිය - පස් පිරවීම | | - | 1,304,000.00 |
| ඉදිකිරීම් ප්‍රගතිය - නව කාර්යාල ගොඩනැගිල්ල | | 180,000.00 | |
| | | 180,000.00 | 11,836,109.07 |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **යටිතල පහසුකම්, පිරියත හා උපකරණ** | **6** | | |
| යන්ත්‍රෝපකරණ | | 2,134,152.60 | 1,428,764.12 |
| ලී බඩු | | 2,552,159.57 | 1,908,995.15 |
| වාහන | | 3,322,004.00 | 6,328,003.00 |
| පරිඝනක | | 271,707.40 | 178,970.60 |
| වෛද්‍ය උපකරණ | | 55,985,537.69 | 46,374,873.16 |
| | | 64,265,561.26 | 56,219,606.03 |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | 7 | | |
| ඉඩම් | | 24,980,041.00 | 18,627,500.00 |
| ගොඩනැගිලි & සවිකිරීම් | | 146,258,489.78 | 131,849,929.59 |
| | | 171,238,530.78 | 150,477,429.59 |
| **උපචිත වියදම්** | 8 | | |
| විගණන ගාස්තු | | 1,450,000.00 | 1,050,000.00 |
| TEC සාමාජික ගාස්තු | | | - |
| විදුලි බලය | | 592,359.71 | 604,595.66 |
| දුරකතන ගාස්තු | | 20,916.73 | 41,450.41 |
| ඉන්ධන | | 69,350.00 | 61,269.79 |
| ගමන් වියදම් | | 5,018.00 | 2,450.00 |
| ඖෂධ තොග | | 93,965.00 | 15,363.70 |
| වෛද්‍ය උපකරණ | | 197,573.00 | - |
| Rep. වෛද්‍ය උපකරණ | | 632,522.40 | - |
| Con. වෛද්‍ය උපකරණ | | 723,410.00 | - |
| රසායනාගාර රසායන ද්‍රව්‍ය | | 675,123.56 | - |
| යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා | | 24,500.00 | - |
| වෙළඳ දැන්වීම් | | 86,025.00 | - |
| Con. සාමාන්‍ය ඖෂධ ගබඩා | | 42,180.00 | - |
| ජලය | | 1,620.60 | - |
| **ඉගෙවීමට ඇති දෑ** | | | |
| ආපසු ලබා දෙන ටෙන්ඩර් තැන්පත් | | 170,000.00 | 258,000.00 |
| රැඳවුම් මුදල | | 975,452.84 | 297,395.00 |
| දීමනාව - බාහිර වෛද්‍යවරු | | 47,000.00 | 95,000.00 |
| අභ්‍යාසලාභී දීමනාව - කාර්යාල | | | |
| කාර්යමණ්ඩලය | | - | 64,000.00 |
| - Pupil NO | | 629,676.82 | 470,222.40 |
| - Pupil Para | | 159,896.78 | 97,401.60 |
| උප කම්කරු පාරිශ්‍රමික | | 242,477.93 | 336,446.20 |
| අතිකාල, අතිරේක තීරුබදු & PH ගෙවීම් | | 1,419,427.19 | 1,122,439.00 |
| සුබසාධන සංගමය | | 5,484.00 | 8,526.00 |
| | | **8,263,979.56** | **4,524,559.76** |

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **ණයගැතියෝ** | 9 | | |
| SPC | | 20,407,150.70 | 13,479,444.20 |
| MSD | | 8,338,325.90 | 2,828,991.97 |
| සීමා. සුපර් විල්ෂයින් | | 5,634,506.16 | 2,748,459.41 |
| වාමිං සෙකියුරිටි | | 293,173.20 | 293,173.20 |
| ත්‍රිපිඉංජිනියරිං | | 335,536.72 | 664,919.33 |
| එරන්දි සප්ලයර් | | 1,800,080.68 | 1,047,184.52 |
| නලින් තුෂාර | | - | 60,000.00 |
| වීරමුන්ඩ | | 165,000.00 | |
| STC | | 139,018.38 | |
| සරත් හාඩ්වෙයා | | 69,947.00 | |
| NERD | | 241,980.00 | |
| | | 37,424,718.74 | 21,122,172.63 |
| **සංචිත** | 10 | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 30,070,612.79 | 21,420,375.65 |
| | | 30,070,612.79 | 21,420,375.65 |
| **ප්‍රාග්ධනය & සංචිත** | 11 | | |
| විජය කුමාරතුංග අනුස්මරන පදනම | | 29,632,139.32 | 29,632,139.32 |
| ආයෝජන මණ්ඩලය<br>නා. | | 28,155,751.12 | 28,155,751.12 |
| සං. අ. | | 18,000,000.00 | 18,000,000.00 |
| | | 75,787,890.44 | 75,787,890.44 |

**රාජ්‍ය ප්‍රදාන- ප්‍රාග්ධන** 12

| | 1/1/2015 දිනට | වසරේ එකතුවීම | ක්‍රමක්ෂය | 31/12/2015 දිනට |
|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 138,054,742.32 | 50,000,000.00 | 20,468,314.18 | 167,586,428.14 |
| වාහන -ඩබල් කැබ් රථය WPPC 4087 භාණ්ඩාගාරය මගින් | 3,360,000.00 | | 1,120,000.00 | 2,240,000.00 |
| ගිලන් රථය - WPLW - 0961 සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් | 4,308,000.00 | | 1,436,000.00 | 2,872,000.00 |
| | 145,722,742.32 | 50,000,000.00 | 23,024,314.18 | **172,698,428.14** |

| | | 2015 | 2014 |
|---|---|---|---|
| රාශිභූත හිඟය | 13 | | |
| B/F ශේෂය - 01.01.2013 දිනට | | (30,214,301.93) | (33,293,533.83) |
| කාලසීමාව තුල අතිරික්තය | | (20,023,883.72) | 3,558,018.10 |
| පූර්ව වසරේ ගැලපුම් | | 479,905.38 | (478,786.20) |
| | | (49,758,280.27) | (30,214,301.93) |

| | | | |
|---|---|---|---|
| වෙනත් ආදායම් | 14 | | |
| පුද්ගලික වෛද්‍ය සහතික ගාස්තු | | 226,850.00 | 192,550.00 |
| සුළු ආදායම් | | 170,075.00 | 103,684.00 |
| ටෙන්ඩර් කැන්පත් - ආපසු නොගෙවන | | 154,500.00 | 131,000.00 |
| ආපදා ණය පොලී | | 350,790.53 | 329,768.51 |
| අක්ෂි සැත්කම් ගාස්තු - ප්‍රධාන | | 17,366,000.00 | 19,065,500.00 |
| අක්ෂි සැත්කම් ගාස්තු - සුළු | | 191,500.00 | 212,000.00 |
| සාමාන්‍ය සැත්කම් - ප්‍රධාන | | 16,000.00 | 40,000.00 |
| සාමාන්‍ය සැත්කම් - සුළු | | 95,000.00 | 80,000.00 |
| පොලී - විශේෂ අත්තිකාරම් | | 14,491.60 | 7,678.46 |
| කුලී | | | |
| FFA | | 16,000.00 | 45,500.00 |
| FLT | | 127,500.00 | 132,500.00 |
| පළාත් | | 32,000.00 | 74,000.00 |
| Lid | | 2,000.00 | 10,000.00 |
| Yag PI | | 45,400.00 | 57,400.00 |
| PRP | | 129,150.00 | 144,200.00 |
| HVF | | 135,750.00 | 181,750.00 |
| Yag Capsulomy | | 784,700.00 | 765,100.00 |
| OCT | | 1,591,000.00 | 771,000.00 |
| Grid | | 19,000.00 | 3,500.00 |
| ආහාර | | 8,350.00 | |
| | | 21,476,057.13 | 22,347,130.97 |

| | | **2015** | **2014** |
|---|---|---|---|
| **<u>වියදම්</u>** | **15** | | |
| පාරිශ්‍රමික, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | | | |
| වැටුප් & දීමනා | | | |
| වැටුප් & දීමනා - වෛද්‍ය නිලධාරී | | 30,330,403.56 | 25,367,457.37 |
| වැටුප් & දීමනා - වෙනත් | | 6,030,249.59 | 4,440,624.78 |
| වැටුප් & දීමනා - පරිපූරක | | 9,297,197.74 | 6,657,336.82 |
| වැටුප් & දීමනා - NO | | 38,118,956.02 | 27,749,472.88 |
| වැටුප් & දීමනා - සුළු සේවක | | 32,514,885.53 | 22,035,565.54 |
| E.P.F. 12% | | 7,437,138.06 | 4,952,295.48 |
| E.T.F. 3% | | 1,858,349.39 | 1,238,073.89 |
| අතිකාල - වෙනත් | | 393,756.02 | 368,162.00 |
| අතිකාල - පරිපූරක වෛද්‍ය | | 521,898.95 | 468,571.00 |
| අතිකාල - සාත්තු සේවිකා | | 6,128,274.19 | 5,403,291.00 |
| අතිකාල - සුළු සේවක | | 3,687,748.32 | 3,312,551.00 |
| අතිරේක නිරුබඳු ගෙවීම (M/O) | | 3,487,718.25 | 2,422,988.00 |
| පාරිතෝෂිත වියදම් | | 8,525,242.14 | 4,378,954.78 |
| | | 148,331,817.76 | 108,795,344.54 |

<u>සැපයුම් පාරිභෝජනය</u>

| 2015 | ආරම්භක තොග 01.01.2015 දිනට | 2015 මිලදී ගැනීම් | 31.12.2015 දිනට අවසාන තොගය | වසරේ පාරිබෝජන |
|---|---|---|---|---|
| රසායනාගාර රසායන ද්‍රව්‍ය | 645,855.89 | 1,588,484.06 | 579,056.78 | 1,655,283.17 |
| එක්ස්රේ පටල & රසායන ද්‍රව්‍ය | 104,001.63 | 1,155,159.00 | 691,690.14 | 567,470.49 |
| ඖෂධ | 10,218,755.29 | 70,925,900.77 | 18,642,050.23 | 62,502,605.83 |
| රෙදි වර්ග | 141,945.07 | 89,570.00 | 109,037.07 | 122,478.00 |
| පරිභෝජ්‍ය & පොදු ගබඩා | 271,894.54 | 917,650.26 | 223,272.33 | 966,272.47 |
| ලිපිද්‍රව්‍ය | 140,500.79 | 492,423.61 | 154,042.22 | 478,882.18 |
| අලුත්වැඩියා & නඩත්තු (ii) | 124,674.10 | 378,042.80 | 65,316.18 | 437,400.72 |
| දත්ත පාරිබෝජනයට ගත හැකි | | 234,140.00 | | 234,140.00 |
| යොදාගත් වෛද්‍ය උපකරණ | | 2,086,360.00 | | 2,086,360.00 |
| නිල ඇඳුම් | | 912,624.00 | | 912,624.00 |
| ගෑස් | | 367,604.00 | | 367,604.00 |
| | 11,647,627.31 | 79,147,958.50 | 20,464,464.95 | **70,331,120.86** |

| | 2015 | 2014 |
|---|---|---|
| සැපයුම් භාවිතාව 16 | | |
| රසායනාගාර රසායනද්‍රව්‍ය | 1,655,283.17 | 953,904.61 |
| එක්ස්රේ පටල & රසායනික ද්‍රව්‍ය | 567,470.49 | 226,546.61 |
| ඖෂධ | 62,502,605.83 | 50,232,435.76 |
| රෙදි වර්ග | 122,478.00 | 309,254.74 |
| පරිභෝජ්‍ය & පොදු ගබඩා | 966,272.47 | 590,193.90 |
| ලිපිද්‍රව්‍ය | 478,882.18 | 481,624.11 |
| අලුත්වැඩියා & නඩත්තු (ii) | 437,400.72 | 564,802.74 |
| දන්ත පාරිභෝජනයට ගත හැකි | 234,140.00 | 194,910.00 |
| යොදාගත් වෛද්‍ය උපකරණ | 2,086,360.00 | 2,585,141.24 |
| නිල ඇඳුම් | 912,624.00 | 1,015,663.00 |
| ගෑස් | 367,604.00 | 611,361.00 |
| | 70,331,120.86 | 57,765,837.71 |
| ක්ෂය 17 | | |
| ගොඩනැගිලි & සවිකිරීම් | 3,517,695.31 | 3,159,170.20 |
| වාහන | 3,005,999.00 | 3,006,000.00 |
| ලී බඩු, සවිකිරීම් & උපකරණ | 528,146.66 | 522,580.70 |
| යන්ත්‍රෝපකරණ | 595,892.00 | 403,363.07 |
| පරිගණක | 104,467.20 | 78,978.40 |
| වෛද්‍ය උපකරණ | 15,350,312.56 | 11,759,297.50 |
| | 23,102,512.73 | 18,929,389.87 |

| | 2015 | 2014 |
|---|---|---|
| **ගමන් වියදම්** | | |
| 18 | | |
| ගමන් වියදම් & යැපීම් දීමනාව (වෙනත් නිලධාරීන්) | 26,856.75 | 75,105.00 |
| **නඩත්තු** | | |
| විදුලි | 7,291,547.98 | 8,764,622.71 |
| ජල | 1,657,634.82 | 1,644,721.57 |
| දුරකථන | 297,313.28 | 502,447.47 |
| තැපැල් | 17,373.00 | 19,515.00 |
| **අලුත්වැඩියා & නඩත්තු** | | |
| අලුත්වැඩියා & නඩත්තු - ගොඩනැගිලි | 153,888.66 | 161,292.85 |
| අලුත්වැඩියා & නඩත්තු - යන්ත්‍රෝපකරන | 1,227,087.62 | 1,138,046.14 |
| අලුත්වැඩියා & නඩත්තු - වාහන | 598,001.45 | 508,656.58 |
| අලුත්වැඩියා & නඩත්තු - පරිගණක | 223,300.00 | 4,750.00 |
| අලුත්වැඩියා & නඩත්තු - වෛද්‍ය උපකරණ | 1,707,003.99 | 1,487,215.00 |
| අලුත්වැඩියා & නඩත්තු - ලී බඩු | 12,000.00 | |
| **කොන්ත්‍රාත්තුමය සේවා** | | |
| පිරිසිදු කිරීම | 5,634,506.16 | 4,769,338.95 |
| රෙදිසේදීම් | 660,000.00 | 720,000.00 |
| ආරක්ෂක | 3,371,628.55 | 3,480,334.80 |
| ආහාර සැපයුම් | 5,183,876.85 | 5,863,874.48 |
| **වෙනත්** | | |
| පරිපාලන මණ්ඩල සාමාජික ගාස්තු | 63,000.00 | 48,500.00 |
| සුළු වියදම් | 817,229.57 | 350,423.70 |
| ප්‍රචාරක දැන්වීම් | 731,323.50 | 641,312.00 |
| රක්ෂණ මුදල් & මාර්ගස්ථ | 6,095.40 | 11,709.30 |
| වෙනත් බැංකු ගාස්තු | 31,573.00 | 55,052.00 |
| විගණක ගාස්තුව | 400,000.00 | 400,000.00 |
| නීතිඥ ගාස්තු | | 3,850.00 |
| කුලී | 318,153.31 | 224,726.95 |
| විදුලිජනක යන්ත්‍ර ඉන්ධන | 114,800.00 | |
| **වාහන වියදම්** | | |
| ඉන්ධන | 778,675.00 | 937,228.79 |
| රක්ෂණ | 404,373.59 | 254,096.96 |
| ලියා./ බලපත්‍ර ගාස්තු | 31,561.20 | 40,061.43 |
| | 31,758,803.68 | 32,106,881.68 |

පරිත්‍යාග ගිණුම

| | | | |
|---|---|---|---|
| B/F ශේෂය | 19 | 1,323,877.55 | 461,894.60 |
| කාලය තුල පරිත්‍යාග | | 537,236.98 | 861,982.95 |
| | | 1,861,114.53 | 1,323,877.55 |

# විජය කුමාරතුංග අනුස්මරන රෝහල - සීදූව

## ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

### 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා

| | මහාභාණ්ඩාගාර ප්‍රදාන | රාජ්‍ය ප්‍රදාන – ප්‍රාග්ධන | වෙනත් පරිත්‍යාග | විකුලරෝ පදනම | ආයෝජන මණ්ඩලය | UDA | සංචිත - ප්‍රාග්ධන ලාභ (හිඟ) | ශුද්ධ අතිරික්තය/ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2014.12.31 ට ශේෂය | 7,668,000 | 138,054,742 | 1,323,878 | 29,632,139 | 28,155,751 | 18,000,000 | 2,131,366 | (30,214,302) | 194,751,574 |
| වසරෙ පරිත්‍යාග | | | 537,236 | | | | | | 537,236 |
| ලත් ප්‍රාග්ධන ප්‍රදාන වසර තුල) | | 50,000,000 | | | | | | | 50,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (2,556,000) | (20,468,314) | | | | | | | (23,024,314) |
| ශුද්ධ අතිරික්තය/ (හිඟය) (කාලය තුල) | | | | | | | | (20,023,884) | (20,023,884) |
| ගතවූ වසරේ ගැලපුම් | | | | | | | | 479,905 | 479,905 |
| 015.12.15 දිනට ශේෂය | **5,112,000** | **167,586,428** | **1,861,114** | **29,632,139** | **28,155,751** | **18,000,000** | **2,131,366** | **(49,758,280)** | **202,720,517** |

## මූල්‍ය කාර්යසාධන ප්‍රවණතාවය - ගතවූ පස් වසර තුල

| අනු අං. | විස්තරය | 2011(000) | 2012(000) | 2013(000) | 2014(000) | 2015(000) |
|---|---|---|---|---|---|---|
| 01 | සමස්ත ජංගම නොවන වත්කම් (WDV) - වසරාවසාන | 184,632 | 195,703 | 201,770 | 206,697 | 235,504 |
| 02 | සමස්ත ජංගම වත්කම් - වසරාවසාන | 19,729 | 17,254 | 26,980 | 23,285 | 42,795 |
| 03 | සමුච්චිත පරමුදල - වසරාවසාන | 204,361 | 212,958 | 230,993 | 241,818 | 278,479 |
| 04 | සමස්ත ජංගම නොවන බැරකම් - වසරාවසාන | 115,044 | 109,226 | 120,187 | 138,054 | 167,586 |
| 05 | සමස්ත පුනරාවර්තන බැරකම් - වසරාවසාන | 26,450 | 32,412 | 54,374 | 47,067 | 75,759 |
| 06 | වසරේ සමස්ත ආදායම | 132,355 | 154,433 | 152,873 | 221,155 | 253,500 |
| | රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 109,933 | 128,070 | 120,250 | 180,000 | 209,000 |
| | ප්‍රාග්ධන ප්‍රදාන | 19,000 | 10,000 | 191,200 | 33,000 | 50,000 |
| | තම ආදායම | 22,362 | 26,363 | 32,623 | 22,347 | 21,476 |
| 07 | වසරේ අතිරික්තය/ හිගය | (3,944) | 3,646 | (20,378) | 3,558 | (20,023) |
| 08 | වසරේ සමස්ත ප්‍රාග්ධන වියදම | 25,921 | 21,744 | 24,745 | 23,863 | 51,909 |
| 09 | වසරේ සමස්ත සේවක පිරිවැය | 68,696 | 77,193 | 90,863 | 108,795 | 148,331 |
| 10 | සමස්ත සේවක සංඛ්‍යාව - වසරාවසාන | 144 | 145 | 163 | 183 | 195 |
| | අනුපාත | | | | | |
| (A) | සමස්ත ආදායමට ආයතන ආදායම | 17% | 17% | 21% | 10% | 8% |
| (B) | එක් සේවකයෙකුගේ මුළු පිරිවැය | 477.00 | 532.00 | 557.00 | 594.00 | 760.00 |

### කාර්යසාධන දර්ශකය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| රෝගීන් සංඛ්‍යාව - සේවා | | | | | |
| බාහිර | 265,864 | 259,994 | 266,342 | 277,414 | 305,495 |
| නේවාසික | 12,372 | 14,079 | 15,963 | 17,378 | 17,620 |
| රෝගියෙකුගේ දිනක පිරිවැය | 2,032 | 2,133 | 2,303 | 2,823 | 3,341 |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදුව.

## සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

1. **පොදු**

1.1 **සකස් කිරීමේ පදනම**

1.1.1. ශේෂ පත්‍රය ආදායම් ප්‍රකාශය සමඟවල වෙනස්වීම් ගිණුම් ප්‍රතිපත්ති සහ මණ්ඩලයේ සටහන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුව සකස් කරන ලදී.

1.1.2 මණ්ඩලයේ මුදල් ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතියට අනුව පිළියෙල කර ඇත.

1.1.3. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කර ඇත.

1.2 **රජයේ ප්‍රධානය**

මණ්ඩලයට රජයේ ප්‍රධාන ක්‍රම දෙකකින් ලැබේ.

1. මූලධන ප්‍රදානය
2. පුනරාවර්තන ප්‍රදානය

1.2.1. මූලධන ප්‍රදානය රජයෙන් සපයනු ලබන කොටස් මූලධනයට සෘජුවම බැර කරනු ලැබේ.

1.2.2. පුනරාවර්තන ප්‍රදානය කාල සීමාව තුල ආදායම වශයෙන් සලකා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

1.3 **බදු**

අදාල කාලසීමාව තුළ මණ්ඩලය ඌනතාවයක් ලබා තිබෙන බැවින් බදු පැනවීමට අවකාශයක් නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

ගිණුම් ප්‍රතිපත්ති නිරතුරුවම උපයෝගී කර ගෙන තිබෙන අතර, ඒවා පසුගිය වර්ෂයේ සංඛ්‍යා අනුකූලව පවතී.

2. **වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම**

2.1 **දේපල, ජනක යන්ත්‍ර සහ උපකරණ ක්ෂයවීම සහ යලි ඇගයීම**

2.1.1. දේපල, ජනක යන්ත්‍ර සහ උපකරණ පිරිවැය වන සේ සමුච්චිත ක්ෂයවීම අඩුකොට දක්වා ඇත. දේපල ජනක යන්ත්‍ර සහ උපකරණවල පිරිවැය වත්කම් ඒවායින් අපේක්ෂිත ප්‍රයෝජනය ලබා ගනු සඳහා ඒවා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට දරන ලද අනියම් වියදම් සමඟ ඉදිකිරීම් හෝ මිළදී ගැනීම් සඳහා දරන ලද පිරිවැයයි. සපයනු ලබන සේවාවන් අඛන්ඩව සිදුකරගෙන යාම සඳහා හෝ සපයනු ලබන, සේවාවල ධාරිතාව වැඩිකිරීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් ලබා ගැනීම පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම මූලධන වියදම වශයෙන් සලකනු ලැබේ.

2.1.2. නිරවුල් ඉඩම් හැර අනෙකුත් වත්කම් සඳහා සෘජු රේඛීය ක්‍රමය භාවිතා කොට පහත සඳහන් ප්‍රමාණයන්ට අනුව ක්ෂයවීම ගණන් බලා ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ සවිකුරු | 2% |
| වාහන | 20% |
| ගෘහ භාණ්ඩ සවිකුරු සහ උපකරණ | 10% |
| යන්ත්‍ර සූත්‍ර | 15% |
| වෛද්‍ය උපකරණ | 15% |
| පරිගණක | 20% |

2.1.3 මිළදී ගැනීමේ හෝ අත්පත් කරගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වලට ප්‍රතිපාදන සලසා තිබෙන අතර ඇවර කරනු ලබන වර්ෂය තුළ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා දී නොමැත.

2.1.4 මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් මුදල් සහ මුදල් සමක, සන්තක මුදල් සහ බැංකු ගත මුදල්වලින් සමන්විත වනු ඇත.

3. **බැරකම් සහ ප්‍රතිපාදන**

3.1 මූලධන බැදීම් සහ අවිනිශ්චිත බැරකම් සියළුම වැදගත් මූලධන වියදම් බැදීම් සහ අවිනිශ්චිත බැරකම්, ශේෂ පත්‍රයේ දිනට ගිණුම්වල එක් සටහනකින් දක්වා ඇත.

3.2 වට්ටෝරු භාණ්ඩ ඇගයීම. වට්ටෝරු භාණ්ඩ පිරිවැය මත ඇගයීමට ලක් කර තිබේ.

4. **ආදායම් සහ වියදම් ගිණුම**

4.1 ආදායම

4.1.1 පෞද්ගලික වෛද්‍ය සභාතික ගාස්තු, රජයේ පුනරාවර්තන ප්‍රදානය සහ අනෙකුත් විවිධ ආදායම් මණ්ඩලයේ ආදායම නියෝජනය කරනු ලැබේ.

4.1.2 සියළුම ආදායම් එකතුවීමේ පදනම මත ගණන් බලා ඇත.

4.2 **වියදම**

4.2.1 වර්ෂය සඳහා අතිරික්තය සහ ඌනතාවය ගණන් බැලීමේදී රෝගී සත්කාර සේවාවන් සහ මූලධන වත්කම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා දරන ලද සියළු වියදම් එකතුවීමේ පදනම මත ආදායමට බර කර ඇත.

ආදායම් සහ වියදම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා එවැනි ක්‍රමයක් උපයෝගී කර ගැනීම නිසා වියදම්වල ස්වභාවය අනුව මණ්ඩලයේ කාර්ය සාධනය මැනවින් විදහා දැක්වෙන බැව් අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/බී/ඩබ්ලිව්කේඑම්එම්එච්/1/15/15    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 නොවැම්බර් [illegible] දින.

සභාපති,

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 04 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව, ගනුදෙනුවක් සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වටිනාකම රු.1,861,115 ක් වූ ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් එවැනි ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.74,243,264 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රියවී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 9 ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.20,464,465 ක් වූ තොගය අගය කිරීම සම්බන්ධයෙන් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හා භාවිතා කළ පිරිවැය සූත්‍රය හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ස්වරූපයේ වියදමක් වූ රෝහල් කාර්ය මණ්ඩලයේ වැටුප් පිළියෙල කිරීම සඳහා රු.200,000 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු මෘදුකාංගයේ (Payroll System) වටිනාකම ප්‍රාග්ධනීත කරනු වෙනුවට ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.12,850,104 කින් වැඩියෙන් ගණනයකර ගිණුම්ගත කර තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ සේවක පාරිතෝෂික වෙන්කිරීම රු.8,525,242 ක් ගැලපීම වෙනුවට ඉකුත් වර්ෂයේ වෙන්කිරීම වූ රු.4,378,955 ක් ගලපා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග අත්හැරීම් හා නිවැරදි ඒකක මිල යොදා නොගැනීම හේතුවෙන් ඉතිරි තොගයේ පිරිවැය රු.47,656 කින් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පවත්වා ගෙන යනු ලබන ලේඛනවලට අනුව ශල්‍යකර්ම වර්ග 4 ක් හා පරීක්ෂණ වර්ග 2 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකර තිබුණු ගාස්තු එකතුව රු.20,346,500 ක් වුවද, මුදල් පොතට අනුව එම අගය රු.19,389,750 ක් වූයෙන් රු.956,750 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 138, 245 හා 257 | සමාලෝචිත වර්ෂය තුළදී වවුචර් 5 කට අදාළව රු.3,276,632 ක් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 (1) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2016 ජූලි 01 දින වන විටත් සිදුකර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සියලු ස්ථාවර වත්කම්වල තොරතුරු ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු නමුත් බඳවා ගැනීමේ පරිපාටි පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ඡේදය | සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.1,178,100 ක්වූ Defibrillator යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණි. |
| (ඉ) 2014 අප්‍රේල් 30 දිනැති අංක ඩීඑම්එස්/1756 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුගත වන පරිදි රෝහල් කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කළයුතු බවට අදාළ ලිපිය මගින් උපදෙස්දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

5

| | | |
|---|---|---|
| (ඊ) | 2015 මැයි 28 දිනැති අංක 01-21/2015 දරන සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛයෙහි උපලේඛන අංක 17 | රජයට අවම පිරිවැයක් වන ආකාරයට අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරිම, ලබා ගැනීම, පිසීම හා බෙදාහැරීම පිළිබඳ කළමනාකරණය සඳහා ආහාර කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. |

(උ) ඖෂධ කළමනාකරණ අත්පොත

| | |
|---|---|
| (i) 3 පරිච්ඡේදයේ 4 (ඇ) ඡේදය | මාසික ඖෂධ සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා එහි ප්‍රගතිය පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කර නොතිබුණි. |
| (ii) 5 පරිච්ඡේදයේ 2 ඡේදය | ඖෂධ තොග පිළිබඳව අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම්, යළි ඇණවුම් මට්ටම හා ආරක්ෂිත තොග මට්ටම පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,023,884 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,558,018 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,581,902 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන වැඩිවීම රු.29,000,000 ක් වුවද වැටුප්, වේතන, සේවක ප්‍රතිලාභ හා සැපයුම් සේවා වියදම් වැඩිවීම රු.52,101,756 ක් වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,944,390 ක ඌනතාවයක් වුවද 2012 වර්ෂය වනවිට එය රු.3,646,870 ක අතිරික්තයක් වී තිබුණි. 2013 වර්ෂයේදී එය නැවතත් රු.20,378,939 ක ඌනතාවයක් බවට පත්වී තිබුණු අතර 2014 වර්ෂය වනවිට රු.3,558,018 ක අතිරික්තයක් බවට පත්වී 2015 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.20,023,884 ක ඌනතාවයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැළකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.65,644,194 ක්වූ මණ්ඩලයේ දායකත්වය සියයට 8 සිට සියයට 59 අතර උච්චාවචනයක් සහිතව 2015 වර්ෂයේදී රු.119,370,321 ක් දක්වා වර්ධනයවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනත ප්‍රකාරව මෙම මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සහ රෝගී තැනැත්තන් රැක බලා ගනු ලබන ආයතනයක් වශයෙන් එය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම මණ්ඩලයේ කර්තව්‍ය විය. එම කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බාහිරව හා නේවාසිකව ප්‍රතිකාර ලබාගත් මුළු රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 294,786 ක් හා 323,362 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රෝගීන්ගේ වැඩිවීම සියයට 10 ක් විය. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ රෝහලේ සමස්ථ වියදම පිළිවෙලින් රු.217,597,454 ක් හා රු.273,524,255 ක් වූ අතර සමස්ථ වියදමේ වැඩිවීම සියයට 26 ක් විය. ඉන් ඖෂධ වියදමේ වැඩිවීම සියයට 24 ක්වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකිරණ පරීක්ෂණ සංඛ්‍යාව 970 කින් හෙවත් සියයට 21 කින් වැඩි වුවද විකිරණ පරීක්ෂණ ද්‍රව්‍ය වියදම රු. 340,923 කින් හෙවත් සියයට 150 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

(ඇ) 2015 පෙබරවාරි මාසයේදී ඉදිකිරීම් නිම කර තිබුණු තුන් මහල් ගොඩනැගිල්ල තුළ 2015 දෙසැම්බර් 31 දින වන විට Laboratory, Chronic Ulcer Care Unit, Utility Rooms හා Wound Care Unit යන අංශ ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද 2016 ජූනි 30 දින වනවිටත් එම අංශ ස්ථාපිත කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ එක් එක් අංශවල අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් විධිමත් පරිදි වාර්ෂික ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය අවශ්‍යතා ඇස්තමේන්තු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු රු.8,453,826 ක් පිරිවැය වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 30 ක් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවී තිබුණි. ඊට අමතරව වෛද්‍ය සැපයුම් අංශයෙන් ඖෂධ මිලදී නොගෙන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.14,493,024 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) තොග ලේඛන නිසි පරිදි පවත්වා නොතිබුණු අතර නිවැරදිව තුලනය කර නොතිබුණි. මේ හේතුවෙන් තොග ලේඛනවල සෘණ ශේෂයන් ඇතිවී තිබූ අතර එම ශේෂයන් ඉවත්වන පරිදි මුළු පිරිවැය රු. 1,456,887 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 32 ක් තොග ලේඛනවලට ඇතුළත් කර තිබුණි.

(ඇ) ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඇණවුම් කිරීම, භාර ගැනීම, නිකුත් කිරීම, තොග ලේඛන පවත්වාගෙන යාම හා තොග ගබඩාව භාරව ක්‍රියා කිරීම සම්බන්ධ කාර්යයන්වල වැඩ බෙදීමක් සිදුවන ආකාරයට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර එම සියළුම කාර්යයන් එක් නිලධාරියෙකු වෙත පවරා තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ අවශ්‍යතාවයට වඩා වැඩි ධාරිතාවයකින් යුත් යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණු බැවින් එම යන්ත්‍ර දෙක ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහතින් දැක්වේ.

(i) 2013 වර්ෂයේදී රු.2,500,000 ක් වැය කරමින් මිලදීගෙන තිබුණු Fully Automated Hematology Analyzer යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී පැයකට පරීක්ෂණ ඒකක 17 ක් පමණක් සිදුකර තිබුණි.

(ii) 2013 වර්ෂයේදී රු.8,736,000 ක් වැය කරමින් මිලදී ගෙන තිබුණු, Fully Automated Biochemistry Analyzer යන්ත්‍රය මගින් සිදුකළ හැකිව තිබුණු විවිධ පරීක්ෂණ වර්ග 21 ක් අතරින් සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වර්ග 9 ක් පමණක් සිදුකර තිබුණි. තවද මෙම යන්ත්‍රයේ උපරිම ධාරිතාවය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 300 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පැයකට පරීක්ෂණ ඒකක 15 ක් පමණක් සිදුකර තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් 2013 වර්ෂයේදී ලැබී තිබුණු රු.38,000 ක් වටිනා Nebulizer යන්ත්‍රයක් 2016 ජූනි 23 දින වන විටත් භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2000 වර්ෂයේදී රු.765,000 ක් වැයකර මිලදීගෙන තිබුණු අක්ෂි ශල්‍යකර්ම සඳහා භාවිතයට ගන්නා Operating Microscope උපකරණය වර්ෂ 6 කට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

### 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.12,431,157 ක්වූ රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය පවරා තිබුණු කොන්ත්‍රාත්කරුගෙන් දින 112 ක ප්‍රමාද කාලය වෙනුවෙන් රු.672,000 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. බිත්ති හා උළුවහු පුපුරා තිබීම, දොර අගුළු කැඩී තිබීම, වහලයෙන් ජලය කාන්දුවීම හා සිවිලිම ඇදවීම ආදිවූ අඩුපාඩු සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණු අතර උපදේශකවරයා විසින් නිසි අධීක්ෂණයක් හා සුපරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු.817,435 ක්වූ රසායනාගාර ගොඩනැගිල්ලේ පළමු මහල බෙදා වෙන් කිරීම (Partition) හා ජනේල සඳහා ග්‍රිල් (Grill) ආවරණ යෙදීමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලසීමාව අවසන් වනතුරු කොන්ත්‍රාත් වටිනාකමින් අවම වශයෙන් සියයට 5 ක් රඳවා ගැනීමකින් තොරව හා උපදේශකවරයා විසින් නිර්දේශ කර සහතික කරන ලද මැනුම් පත්‍ර සමඟ අවසන් බිල්පත ඉදිරිපත් කර නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත රු.817,435 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

(ඇ) පස් කියුබ් 1,190 ක් පුරවා රෝහල් භූමිය ගොඩකිරීම සඳහා කියුබ් 1 කට රු.3,500 ක් වූ අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද කොන්ත්‍රාත්කරු විසින් පසුව කරන ලද ඉල්ලීමකට අනුව කියුබ් 1 කට රු.4,200 බැගින් ගෙවීම නිසා රු.828,576 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය 216 ක්වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 195 ක් විය. රෝහලේ ප්‍රධාන විධායක තනතුර වන රෝහල් අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩුව වර්ෂ 10 කට වැඩි කාලයක සිට පිරවීමට කටයුතු කර නොතිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනුමැතියකින් තොරව නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට අනුමත වී තිබුණු නිර්වින්දන විශේෂඥ වෛද්‍ය තනතුරේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී බාහිර නිර්වින්දන වෛද්‍යවරයෙකුගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.314,000 ක් වැයකර තිබුණි.

(ඇ) අනුමත වෛද්‍ය රසායනාගාර කාර්මික තනතුරු 3 ක් පුරප්පාඩු වීම හේතුවෙන් රසායනාගාරයේ පවතින අධි ධාරිතාවයෙන් යුත් රසායනාගාර උපකරණවලින් ප්‍රමාණවත් සේවාවක් ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ) රෝහල සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියක් නොතිබීම හේතුවෙන් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ පරිපාටිය උපයෝගී කර ගෙන තිබුණද එම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන නොසළකා වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්දට ලකුණු 45 ක්ද, සම්මුඛ පරීක්ෂණය වෙනුවෙන් ලකුණු 20 ක්ද වශයෙන් ලබාදී, බඳවා ගත හැකි වයස් සීමාව වැඩි කර ඒ වනවිටත් රෝහල තුළ පුහුණුව ලබමින් සිටි 4 දෙනෙකු කළමනාකරණ සහකාරවරුන් වශයෙන් බඳවා ගෙන තිබුණි.

## 5. ශිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය අතර කාලසීමාවට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ ක්‍රියාකාරකම් ඊට ඇතුළත්කර නොතිබුණු අතර වාර්ෂික කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි.

### 5.3 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් 1 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 27 සිට සියයට 420 දක්වා පරාසයක විචලනයන් පැවතුණි. තවද විෂයයන් 5 ක් සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.2,775,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෝහල් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳව මනා අධීක්ෂණයක් සිදු නොකිරීම හා උපරිම කාර්යසාධනයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) තොග පාලනය | තොග පාලනය සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කාර්ය මණ්ඩල බඳවාගැනීම සිදුකර නොතිබීම. |
| (ඈ) අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම හා රෝගීන් වෙත ආහාර ලබාදීම. | අමු ආහාර සපයා ගැනීමේ සිට රෝගීන් වෙත ලබාදීම දක්වා කටයුතුවලදී සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර නොතිබීම හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

11